**බළන්ගොඩ නගර සභාව**

**2022-05-19 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.05.19**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

**01. පසුගිය සභාවේ 2022-04-06 දිනැති මහා සභා වාර්තාව හා 2022-03-30 හා 2022-04-21 දිනැති විශේෂ මහ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-30 හා 2022-04-21 දින පැවති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා, 2022-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-30 හා 2022-04-21 දින පැවති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-30 හා 2022-04-21 දින පැවති විශේෂ මහ සභා වාර්තා සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමන් විසින් නිවේදන වාරය ආරම්භ කරමින් ප්‍රකාශ කලේ කුරගල පුදබිම සඳහා අභිමානයක් හා දායකත්වයක් ලබා දීම වෙනුවෙන් 2022 අයවැය මඟින් ජාතික වෙසක් උත්සවය සඳහා මුදලක් වෙන් කරනු ලැබුව ද පසුගිය කාලයේ පැවති වාතාවරණය නිසා එය අවලංගු කිරීමට සිදු වූ බවයි.

- එමෙන්ම 2022 අයවැය මඟින් මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා වෙන්කල රුපියල් මිලියන 17 ක මුදලෙන් සිදු කිරීමට ඇති කර්මාන්තයන් විවිධ හේතු නිසා අවසන් කිරීමට නොහැකි වූ බැවින් එම කර්මාන්ත ඉක්මනින් ඉටු කර ගන්නා ලෙස පවසන ලදී.

- 2022 අයවැය මඟින් සහන මලු බෙදා දීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 06 ක මුදලක් වෙන් කර ඇති අතර, එම මුදලින් සහන මලු බෙදා දිම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව ද ගරු මන්ත්‍රීවරුන් විසින් නම් ලැයිස්තු ලබා දී නොමැති අතර, තමන් විසින් ලබා දුන් නම් ලැයිස්තුව අනුමත වූ බව ද නම් ලැයිස්තු පවතී නම් හැකි ඉක්මනින් ලබා දෙන ලෙස ද පැවසීය.

- අසනීප තත්ත්වයන් හේතුවෙන් 2022-05-19 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය හා ගරු නාගරික

මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ, මුගුණමලය මාර්ගය පසුගිය දිනවල පැවති වර්ෂාව නිසා අතුරු මාර්ගවලින් හා දිය පාරවල්වලින් ගසා එන වැලි හා පස් මාර්ගය තුල තැන්පත් වී විශාල අගල් හා වලවල් සෑදී වාහනවලට යාමට අපහසු තත්ත්වයේ පවතින බැවින් නගර සභාවේ බැකෝ යන්ත්‍රය මඟින් මෙම පස් ඉවත් කර මාර්ගය පිළිසකර කර දෙන ලෙසත්, ස්ථිර විසඳුමක් ලෙස මාර්ගයේ කාණු පද්ධතිය හා මාර්ගය කාපට් අතුරා ක්‍රමවත්ව සකස් කර දෙන ලෙසත් බළන්ගොඩ, මුගුණමලය සමඟි යහ සාධක සමිතිය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ නගර සභාවේ බැකෝ යන්ත්‍රය ලබා දී එම වැලි හා පස් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

- බළන්ගොඩ නගර සභාවට අයත් බුලත්ගම සුසාන භූමිය තුළ මිලි මීටර් 60 × 60 ප්‍රමාණයේ උසින් මිලිමීටර් 65 ක ප්‍රමාණයේ කුළුණක් ඉදි කර ගැනීමට අවසර ලබා දෙන මෙන් බළන්ගොඩ, තුඹගොඩ, බැංකියවත්ත, එල් 2/5, ලිපිනයේ පදිංචි එම්. සෙල්ලදොරේ යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් පිළිතුරු ලබා දෙමින් සුසාන භූමියේ භූමදානය කළ ස්ථානයේ කුළුණු ඉදි කිරීමට අවසර ලබා නොදීමට සභාව විසින් මීට පෙර අනුමත කර ඇති අතර, 2021-12-03 දිනැති ගැසට් නිවේදනයේ ද අවසර නැති බව සඳහන් කර ඇති  බව ද ඒ අනුව මේ සඳහා අවසර ලබා නොදීමට තීරණය කරන බව පැවසීය.

- බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන කිරිමැටිතැන්න සතිපොළෙහි බැහැර කරනු ලබන කසළ බළන්ගොඩ නගර සභාවේ කසළාංගනය වෙත බැහැර කිරීම සඳහා අවසර ලබා දෙන මෙන් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව නගර සභාවේ අධීක්ෂණය යටතේ සතිපොළෙන් ඉවතලන දිරන එළවළු කසළ පමණක් සතියකට ලෝඩ් 01 බැගින් මාසයකට ලෝඩ් 04 ක් වන පරිදි ගාස්තු අය නොකර එක් මාසයකට පමණක් ලබා ගැනීමටත්, කසළ ලැබෙන ආකාරය නිරීක්ෂණය කර ඉදිරි මාසයන් වෙනුවෙන් අවස්ථාව ලබා දෙන්නේ ද නැද්ද යන්න තීරණය කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

- සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG -5/2/1/2 (iii) හා 2022-04-25 දිනැති බළන්ගොඩ නගර සභාව සතු මැණික් කඩ කාමර සම්බන්ධ ලිපිය මඟින් බළන්ගොඩ නගර සභාවේ මහජන ක්‍රීඩාංගනය අසල පිහිටි කඩ කාමර 08 ක් දැනට සිටින බදුකරුවන් වෙතම නව තක්සේරුව මත ලබා දීම

සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී නැති බවත්, පළාත් පාලන ආයතනයට වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ගැනුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දී ඇති බවත්, දන්වා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පෙ.ව 10.25 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

- පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG 06/05/05 හා 2022-04-18 දිනැති ලිපිය මඟින් “2022 වර්ෂයේ අයවැය මඟින් සංවර්ධන කටයුතු - සභා අරමුදල් සඳහා වෙන් කරන ලද මුදල් සම්බන්ධවයි” යන මාතෘකාව යටතේ එවා ඇති ලිපියෙහි සඳහන් කරුණු ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බුලත්ගම තලාව පාර කොන්ක්‍රීට් කර එහි ආරක්ෂාව සඳහා වම්පස කළුගල් බැම්මක් ඉදි කර ඇති අතර, මාර්ගයේ ආරම්භක ස්ථානයේ වම්පස කුඹුර ගොඩ කර අනවසර ලෙස නිවසක් තනා චන්ද්‍රසේන යන පදිංචිව සිටින බවත්, පැති බැම්මේ පාදම දක්වා හාරා වැලි ගොඩ දමා අලෙවි කරන බවත් නීති විරෝධී ගොඩ කිරීම තුළ සිටුවා ඇති දෙල් ගස් සහ පොල් ගස්වලින් මාර්ගයේ ගමන් ගන්නා මගීන් නොයෙක් කරදරවලට මුහුණ පාන බවත් ජීවිත හානි සිදුවීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් පවසමින් නිර්නාමිකව එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා මේ සම්බන්ධව පිළිතුරු ලබා දෙමින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පෙ.ව 10.35 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**05. කල් දී ඇති යෝජනා**

**05:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

05:01:01 බළන්ගොඩ, වෙළගේ, රුක් අත්තන ලිපිනයේ පදිංචි එස්.ජී. ගාමිණී ප්‍රියන්ත කුමාර මහතා විසින් ගලි බවුසර් සේවය ලබා ගැනීම සඳහා රු. 11,750.00 ක මුදලක් ගෙවා ඇති අතර, ස්ථානීය පරීක්ෂාවෙන් පසු අදාල සේවාව ලබා දීමට නොහැකි වූ බැවින් ඔහු වෙත එම මුදල ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:02 බළන්ගොඩ නගර සභාවේ අංශ ප්‍රධාන කමිටුවේ දී තීරණය කර ගත් පරිදි සභාවට අලාභයක් සිදු නොවන ලෙස සේවා පවත්වා ගෙන යාමේ අරමුණින් පවතින වෙළඳපොල තත්ත්වයන් යටතේ මිල ගණන් සංශෝධනය කළ අතර, 2022-04-19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල සේවාවන් නව මිල ගණන් යටතේ ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| **සේවාව** | **පවතින මිල** | **2022-04-19 යෝජිත මිල** |
|---|---|---|
| ජල බවුසරය කුලියට ලබා දීම | | |
| • පානීය ජල බවුසරයක් | රු.4,000.00 | රු.5,000.00 |
| • පානීය නොවන ජල බවුසරයක් | රු.3,750.00 | රු.4,500.00 |
| • ස්ථනයේ නතර කර තැබීම දිනකට | රු.4,000.00 | රු.4,000.00 |
| • සංවර්ධන කටයුතු වලදී ජලය ඉසීම හෝ අමතර ජල බවුසරයකට | රු.1,500.00 | රු.2,000.00 |
| • නගර සභා සීමාවෙන් පිට වැඩිවන සෑම කිලෝමීටරයකටම (Up and Down එකතුව) අයකිරීම | රු. 250.00 | රු. 300.00 |
| JCB යන්ත්‍රය කුලියට ලබා දීම (යන්ත්‍ර පැයකට ක්‍රියාකරු සමඟ) | රු.4,000.00 | රු.5,000.00 |
| ලෙලෙන තලනය කුලියට ලබා දීම | | |
| • ටොන් 01 පැය 08ක සේවා දින භාගයක් සඳහා | රු.4,000.00 | රු.4,500.00 |
| • ටොන් 10 යන්ත්‍ර පැය 01ක් සඳහා ක්‍රියාකරු හා ඉන්ධන සමඟ (පැය 01 ක් සඳහා) | රු.4,325.00 | රු.5,200.00 |
| මෝටර් ග්‍රේඩරය කුලියට ලබා දීම (පැයකට රියදුරු හා ඉන්ධන සමඟ) | රු.4,500.00 | රු.5,500.00 |
| ගලි සේවාව (ලීටර 2500) | | |
| • නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන | රු.6,250.00 | රු.7,500.00 |
| • නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු.7,500.00 | රු.8,500.00 |
| • නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන | රු.10,000.00 | රු.10,000.00 |
| • නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු.10,500.00 | රු.11,500.00 |
| • නගර සීමාවෙන් පිටත වැඩිවන සෑම කිලෝ මීටර් එකක් සඳහා(Up and Down එකතුව ලෙස අයකිරීම) | රු. 250.00 | රු. 300.00 |
| • ලීටර් 4000 ගලි බවුසරය | රු.10,000.00 | රු.14,000.00 |
| • නගර සීමාවෙන් පිටත වැඩිවන සෑම කිලෝ මීටර් එකක් සඳහා(Up and Down එකතුව ලෙස අයකිරීම) | | රු. 400.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

2022-04-19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල සේවාවන් නව මිල ගණන් යටතේ ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 රට තුල උද්ගතව ඇති තත්ත්වය හේතුවෙන් 2022 මාර්තු මස සිට ව්‍යාපාරික කටයුතු අඩාල වූ බැවින් ඉරිදා පොළ භූමියේ ආපන ශාලාවෙහි කුලිය අඩු කිරීම හා කුලිය ගෙවීම ප්‍රමාද වූ මාස සඳහා දඩ මුදලක් අය නොකර සහනයක් ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව 2022 මාර්තු සහ අප්‍රේල් මස සඳහා ඉරිදා පොළ භූමියේ ආපන ශාලාවෙහි කුලිය 50% බැගින් අය කර ගැනීම සුදුසු බවටත්, කුලිය ගෙවීම ප්‍රමාද වූ මාසයන් සඳහා දඩ මුදල් අය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:04 ඉන්ධන මිල ඉහළ යාම නිසා බස් රථ ධාවනය අඩු වූ බැවින් 2022 මාර්තු 01 දින සිට අප්‍රේල් 31 දක්වා බස් රථ ටෙන්ඩරය සම්බන්ධයෙන් වන ගාස්තු අඩු කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මාසයේ බස්රථ 45% ක් හා අප්‍රේල් මාසයේ බස්රථ 50% ක් ධාවනය වී ඇති බවට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් දැනුම් දී ඇති බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව මාර්තු මාසයේ 45% ක් හා අප්‍රේල් මාසයේ 50%ක් වශයෙන් බස් රථ ටෙන්ඩරය සම්බන්ධයෙන් වන ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:05 2021 වර්ෂයේ කොරෝනා වසංගතය පැවති මැයි සිට ඔක්තෝම්බර් දක්වා කාල සීමාවෙහි රථවාහන හා බස් රථ ගමනාගමනය අඩු වූ බැවින් එම කාලයට අදාල ගාස්තු වෙනුවෙන් තවදුරටත් සහන ලබා දෙන ලෙස අදාල ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල කාලසීමාවන් සඳහා සහන ලබා දී ඇති බැවින් නැවත සහන ලබා දීම අවශ්‍ය නොවන බව සභාවේ මතය වූ බැවින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

05:01:06 2022-04-05 දින ඇඳිරි නීතිය පනවා තිබීම හා 2022-04-14 හා 15 යන දෙදින නගරයේ ජනතාව නොගැවසීමත් යන හේතු මත එම දින තුන සඳහා ටෙන්ඩරයෙන් ගෙවිය යුතු මුදල අඩු කර දෙන ලෙස පොදු වැසිකිළි ටෙන්ඩර්කරු විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ටෙන්ඩර් ගිවිසුම් කඩ කරමින් කටයුතු කරන බැවින් හා ගාස්තු ගෙවීම පැහැර හැර ඇති බැවින් මෙම යෝජනාව සභාවේ ප්‍රතික්ෂේප කරන ලදී.

05:01:07 පුස්තකාල සහායිකා තනතුර වෙනුවෙන් සේවා ගිවිසුම් මත හා දෛනික ගෙවීමේ පදනම මත එම්.ඩී.ජේ.පෙරේරා මහත්මිය සේවයේ යොදවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:08 රු. 10,000.00 ක මාසික දීමනාව මත කේ.ඩබ්.අමානි උමේදා යන අය සහ උත්පලා දිල්රුක්ෂි යන අය පෙර පාසල් පාලිකා සේවයේ යොදවා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කේ.ඩබ්. අමානි උමේදා හා උත්පලා දිල්රුක්ෂි යන අය බළන්ගොඩ නගර සභා පෙර පාසලේ පුහුණුව සඳහා පැමිණි අතර, ඉන් සුදුසුකම් සපුරා ඇත්තේ කේ.ඩබ්. අමානි උමේදා යන බව ද ඇය වැවේවත්ත පෙර පාසල සඳහා යොමු කර

තිබුණු බව ද තීරණයක් ගැනීම සඳහා මෙම දෙදෙනා විසින් කරන ලද ඉල්ලීම සභාවට ඉදිරිපත් කළ බව ද පැවසීය.

මේ සම්බන්ධව ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙමින් පවතින නිසා එම ඉල්ලීම් සලකා බැලිය යුතු බැවින් මෙම යෝජනාව සභාවේ ප්‍රතික්ෂේප කරන ලදී.

05:01:09 ප්‍රසන්න අල්විස් යන අය විසින් ඉදි කරනු ලබන ගොඩනැගිල්ලේ මායිම් බිත්තිය නගර සභා ඉඩමේ මායිම වනසේ ඉදි කිරීමට කටයුතු කර ඇති අතර, එහි ඉදිරිපස කොටසේ නගර සභාව විසින් ඉදි කර ඇති පැති බැම්ම ඔහුගේ ඉඩම වෙත තල්ලු වී ඇති බැවින් එම කොටසේ පැති බැම්ම හා මායිම් තාප්පය ඉදි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:10 බළන්ගොඩ, තුඹගොඩ, වෙට්නෝල් පටුමග, අංක 16/20 ඕ ලිපිනය සහිත ස්ථානයේ පිහිටා ඇති ජයන්ත හෙන්දාවිතාරණ යන අයගේ නිවස පිටුපස තාප්පය සහ එම්.මහේෂ්වරී යන අයගේ නිවස පිටුපස තාප්පය යන තාප්ප දෙක හා නගර සභාවට අයත් කාණුව ඉදි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ජයන්ත හෙන්දාවිතාරන අය විසින් ඔහුගේ නිවස පිටුපස ඇති නගර සභාවට අයත් කාණුව නිසා තාප්පය කඩා වැටීමට ලක් විය හැකි බැවින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර මෙම කාණුව තාප්පයට තර්ජනයක් නොවන පරිදි ඉදි කරන ලෙස 2018 ජනවාරි 08 වන දින ලිපියක් මඟින් බළන්ගොඩ නගර සභාව දැනුවත් කර ඇති නමුත් සභාව මේ සම්බන්ධව ක්‍රියාමාර්ග නොගැනීම නිසා පසුගිය දිනක මෙම තාප්පය කඩා වැටී නිවසකට ද හානි සිදු වී ඇති බව ද තමන් ඇතුළු ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු හා වැඩ අධිකාරීතුමා කළ ස්ථානීය පරීක්ෂණයේ දී ද මෙම ආපදාව සිදුව ඇත්තේ නගර සභාවට අයත් කාණුව හේතුවෙන් බවට හඳුනා ගත් බව ද මේ නිසා ජයන්ත හෙන්දාවිතාරණ යන අයගේ හා අසල නිවසෙහි පදිංචි එම්.මහේෂ්වරී යන අයගේ තාප්ප ද නගර සභාවට අයත් කාණුවද ඉදි කර දීමට සිදුව ඇති බව පවසන ලදී.

ඒ අනුව කාණුව ඉදි කිරීම සඳහා රු. 641,000.00 ක් ද ජයන්ත හෙන්දාවිතාරණ යන අයගේ නිවස පිටුපස තාප්පය ඉදි කිරීම සඳහා රු. 1,134,000.00 ක් ද එම්.මහේෂ්වරී යන අයගේ නිවස පිටුපස තාප්පය ඉදි කිරීම සඳහා රු. 388,000.00 ක් වශයෙන් රු. 2,163,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇති බවද ජයන්ත හෙන්දාවිතාරන හා එම්.මහේෂ්වරී යන අය විසින් තම තමන්ගේ නිවාස පිටුපස පවතින තාප්ප ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තුගත මුදලින් 30%

බැගින් දායකත්වය ලබා දෙන බව පැවසූ බැවින් එම මුදල් තැන්පත් කළ පසු අදාල කර්මාන්ත සිදු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙය පුද්ගලික කටයුත්තක් නේදැයි විමසූ අතර, රු. ලක්ෂ 21 ක් පමණ වන මුදලින් රු. ලක්ෂ 14 ක් පමණ සභාවෙන් දැරීමට සිදු වන බව පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ තාප්පයන් සඳහා වන ඇස්තමේන්තු මුදලින් 30% බැගින් එම නිවෙස් හිමියන් ලබා දෙන බවත්, මෙම කාණුව විධිමත්ව ඉදි නොකළහොත් ඉදිරියේ දී සිදුවන ආපදාවන්වල දී කෝටි ගණනක වියදමක් සභාවට දැරීමට සිදුවිය හැකි බවත් ය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතියට යටත්ව මෙම තාප්ප දෙක ඉදිකිරීමටත්, ජයන්ත හෙන්දාවිතාරණ යන අයගේ තාප්පය ඉදි කිරීම සඳහා වන රු. 1,134,000.00 ක ඇස්තමේන්තු මුදලින් 30% ක් එනම්, රු. 340,200.00 ක මුදල හා අසල නිවසෙහි පදිංචි එම්.මහේෂ්වරී යන අයගේ තාප්පය ඉදි කිරීම සඳහා වන රු. 388,000.00 ඇස්තමේන්තු මුදලින් 30% ක් එනම්, රු. 116,400.00 ක මුදල අදාල අය විසින් සභාවේ තැන්පත් කළ පසු එම කර්මාන්ත ආරම්භ කිරීම සුදුසු බවට ද මෙම ආපදාවන්ට හේතු වූ නගර සභාවට අයත් කාණුව නැවත විධිමත්ව ඉදි කිරීම සුදුසු බවට ද ගරු සභාපතිතුමන් විසින් කළ සංශෝධිත යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:11 2022 මැයි මාසය සඳහා කාර්ය සාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:12 බළන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඇති ඖෂධ පැල යොදා ගනිමින් නගර සභා සීමාව තුල ඇති පාසල්වල ඖෂධ උයන් ස්ථාපිත කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:13 ZA 5039 JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ZA 5039 JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අදාලව එම යන්ත්‍ර නියෝජිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් යොමු කර ඇති 2022-05-05 දිනැති ලිපිය මඟින් එය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වයර් හනස්ස ගෙන්වීමට නොහැකි බව දන්වා ඇති අතර, එම නිසා යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට එම ආයතනය වෙත ප්‍රවාහනය කිරීමේ දී ප්‍රවාහන ගාස්තු ලෙස අධික මුදලක් වැය කිරීමට සිදු වන බැවින් මෙම යන්ත්‍රයේ අලුත්වැඩියාවන් 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සභාවේ ලියාපදිංචි ගරාජය වෙත යොමු කර අලුත්වැඩියා කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:14 බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය 20KVA ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සලකා බලා තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් නගර සභාව සඳහා අවශ්‍ය 20KVA ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම සම්බන්ධව,

- ✓ විදුලි ඉංජිනේරු, ඩබ්.කේ.ජේ.ඊ. වීරසිංහ මහතා (කමිටු සභාපති)
- ✓ නාගරික ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මහතා
- ✓ ගණකාධිකාරී, එම්.ඩී.එස්. ප්‍රනාන්දු මහතා
- ✓ වැඩ අධිකාරී, පී.ඩබ්.එස්. සේනාධීර මහතා

යන සාමාජිකයින්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2022-04-21 දිනැතිව ලබා දී ඇති වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාවෙහි වර්තමානයේ රට තුල උද්ගතව ඇති ආර්ථික හා දේශපාලනික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ඩොලරයට සාපේක්ෂව රුපියල සීඝ්‍රයෙන් අව ප්‍රමාණය වීම, ආනයනය කිරීමේ දී ණයවර ලිපි විවෘත කිරීමේ දී ඇති වී ඇති ගැටලු හා භාණ්ඩ ගෙන්වීම සීමා කර තිබීම, වෙළඳපළ තුල භාණ්ඩ නොමැතිකම, ක්ෂණිකව සිදුවන මිල උච්චාවචනය, ඇස්තමේන්තු මුදල සීඝ්‍රයෙන් වෙනස් වීමට ඇති හැකියාව හා රට තුල පවතින විදුලි කප්පාදුව හේතුවෙන් අත්‍යවශ්‍ය මහජන සේවා හා කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා විදුලි බල සැපයුමක්

බළන්ගොඩ නගර සභාව වෙත අවශ්‍ය බව නිරීක්ෂණය වන බැවින් එකී කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇති බව සටහන්ව ඇති බව ද,

ආයතන 16 ක් වෙත ලංසු කැඳවීමේ ලිපි නිකුත් කල ද එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබීම පිළිබඳව සැලකිල්ල යොමු කර සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරු වන Metropolition Technologies වෙතින්

| | | |
|---|---|---|
| unit | – Rs. 3,190,000.00 | + VAT |
| ATS unit | – Rs. 230,000.00 | + VAT |
| Power cables 25M | – Rs. 250,000.00 | + VAT |
| Service agreement | – Rs. 483,523.00 | + VAT (2 service per year) |

මුදලට 20KVA ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම නිර්දේශ කර ඇති බව ද 2022-04-21 දිනට ඇ.ඩො.එකක මිල රු. 340.00 ක් බව සඳහන්ව ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

එම නිර්දේශ අනුව, දිනෙන් දින මිල ගණන් ඉහළ යාම හේතුවෙන් නැවත ලංසු කැඳවීමෙන් මෙම මුදල තවදුරටත් ඉහළ යා හැකි බැවින් හා ඉදිරිපත් කර ඇති ආයතනය පිළිගත් ආයතනයක් වන බැවින් එම ලංසුව පිළිගැනීම සුදුසු බව ද ඒ අනුව,

| | | |
|---|---|---|
| unit | – Rs. 3,190,000.00 | + VAT |
| ATS unit | – Rs. 230,000.00 | + VAT |
| Power cables 25M | – Rs. 250,000.00 | + VAT |
| Service agreement | – Rs. 483,523.00 | + VAT (2 service per year) |

මුදලට Metropolition Technologies වෙතින් 20KVA ඩීසල් ජෙනරේටරයක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:15 බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතියේ වියලුම් කුටීර සකස් කිරීම (බැංකියවත්ත කසළ මධ්‍යස්ථානයේ මළ අපද්‍රව්‍ය ප්‍රතිකාර ඒකකය සංවර්ධනය කිරීම) වෙනුවෙන් අදාල ඇස්තමේන්තුවේ සඳහන් මුළු මුදල වන රු. 1,226,541.16 න් ලක්ෂ 10 ක මුදල පළාත් සභාවෙන් අනුඥාත වූ අතර, එම මුදල ගෙවා ඇත. එහෙත් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ අනුඥාත රුපියල් ලක්ෂ 10 සඳහා පමණක් ගිවිසුම සකස් කරන ලෙස ලබා දී ඇති වාචික උපදෙස් හේතුවෙන් ගිවිසුම්ගත මුදල පමණක් ගෙවා ඇතත් වැඩ අධිකාරී මහතාගේ වාචික උපදෙස් මත කොන්ත්‍රාත්කරු අත්‍යවශ්‍ය වැඩ කොටස් ඉටු කිරීමේ දී ගිවිසුම් මුදල ඉක්මවා වැඩ කර ඇති බැවින් සමස්ථ කර්මාන්තයේ ඵලදායිතාවය සලකා බලා අනුමත ඇස්තමේන්තුවේ ඇතුලත් වැඩ කොටස් ඉටු කිරීමට අදාල රු. 33,408.40 ක මුදල සුබ සරණ ජොෂ්ඨ පුරවැසි සංගමය වෙත

ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම හා ෆිල්ටරයේ ඉතිරි කොටස් සෘජු කම්කරු ශ්‍රමය යටතේ ඉටු කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් සුබ සරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය විසින් ගිවිසුමට අතිරේකව ඉටු කළ වැඩ සඳහා රු. 33,408.40 ක මුදල ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, කර්මාන්තයේ සමස්ථ ඵලදායිතාවය වෙනුවෙන් ඉටු කළ යුතුවම තිබූ එම මුදලට අදාල කාර්යය අවසන් කර ඇති බැවින් අදාල ප්‍රජා පාදක සංවිධානය වෙත මෙම මුදල ගෙවීම සුදුසු බව ද ෆිල්ටරයේ ඉතිරි කොටස් සෘජු කම්කරු ශ්‍රමය යටතේ ඉටු කිරීම සුදුසු බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:16 පහත සඳහන් අය වෙත ලබා දෙන ලද ණය මුදල අය කර ගැනීමේ දී වාරිකවලින් වැඩිපුර අය වී ඇති අතර, එම මුදල් ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

**කාර්ය සාධන ණය**

| | | |
|---|---|---|
| i. | සී. ජයන්ත මයා | - රු. 12,769.50 |
| ii. | නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා | - රු. 7,017.00 |

**උත්සව අත්තිකාරම්**

| | | |
|---|---|---|
| i. | සම්පත් විජය බණ්ඩාර මයා | - රු. 1036.70 |
| ii. | ටී. සුබ්‍රමනියම් මයා | - රු. 1036.70 |
| iii. | පී. කනගරාජා මයා | - රු. 1036.70 |
| iv. | ටී.ඒ. ප්‍රේමසිරි මයා | - රු. 1036.70 |
| v. | සමරදාස සෝමසිංහ මයා | - රු. 1036.70 |
| vi. | බී.ආර්. කරුණාදාස මයා | - රු. 1036.70 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ටී.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:17 බළන්ගොඩ බස්නැවතුම්පොළ පොදු වැසිකිළි සහ මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ ටෙන්ඩරයේ ගිවිසුම් කඩ කර ඇති බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වැසිකිළි පරිහරණය කිරීමේ දී පාරිභෝගිකයෙකුගෙන් අය කරනු ලබන රු.10.00 ක මුදල වෙනුවට රු.20.00 ක මුදලක් අය කරන බවට හා වැසිකිළි පවිත්‍රතාවය හා නඩත්තුව නිසි පරිදි ඉටු නොවන බවට සෞඛ්‍ය පරිපාලක විසින් දැනුම් දුන් අතර, ඒ අනුව 2022-04-06 දිනැති මහ සභාවේ අංක 06:01:13 යටතේ අවවාද කර ලිපියක් අදාල ටෙන්ඩර්කරු වෙත නැවත වරක් අවසාන දැනුවත් කිරීම වශයෙන් ලබා දීමටත්, එසේ අවවාද කිරීමෙන් පසුව ද ගිවිසුම් කඩ කරන්නේ නම් සභාවට පවරා ගන්නා බවටත් සභා අනුමැතියක් ලබා ගත් අතර, නැවත නැවතත් ගිවිසුම් කඩ කරමින් කටයුතු කරන බැවින් අද දින පොදු වැසිකිළි ටෙන්ඩරය සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

මේ සම්බන්ධව සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව බළන්ගොඩ බස්නැවතුම්පොළ පොදු වැසිකිළි සහ මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ ටෙන්ඩරය අවලංගු කර සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කරන තුරු පොදු වැසිකිළි නඩත්තු සහ පිරිසිදු කිරීමේ කටයුතු සභාව මඟින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:18 බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය හර්තාල්, ඇඳිරිනීතිය හා වෙසක් උත්සවය වෙනුවෙන් දින 07 ක් වසා තිබූ බැවින් එම කාලයට අදාලව ගාස්තු අය නොකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව හර්තාල් පැවති 2022-05-06 දින සහ ඇඳිරිනීතිය පැවති 2022-05-10 හා 11 යන දිනයන් ද වෙසක් උත්සවය වෙනුවෙන් වසා පැවති 13, 14,15,16 යන දිනයන් ද වශයෙන් දින 07 ක කාලයට අදාලව ගාස්තු අය නොකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:19 බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය හර්තාල්, ඇඳිරිනීතිය හා වෙසක් උත්සවය වෙනුවෙන් දින 07 ක් වසා තිබූ බැවින් එම කාලයට අදාලව ගාස්තු අය නොකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව හර්තාල් පැවති 2022-05-06 දින සහ ඇඳිරිනීතිය පැවති 2022-05-10 හා 11 යන දිනයන් ද වෙසක් උත්සවය වෙනුවෙන් වසා පැවති 13, 14,15,16 යන දිනයන් ද වශයෙන් දින 07 ක කාලයට අදාලව ගාස්තු අය නොකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:20 ඉන්ධන අර්බුදය මෙන්ම උද්ඝෝෂණ සහ පෙළපාලි හේතුවෙන් රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමේ දුෂ්කරතාවයකට පත්ව ඇති බැවින් 2022 අප්‍රේල් මාසය සඳහා සහනයක් ලබා දෙන ලෙස රථ වාහන ටෙන්ඩර්කරු විසින් දන්වා ඇති අතර, මේ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව රට තුල පවතින අර්බුදකාරී තත්ත්වය සලකා බලා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රථවාහන ටෙන්ඩරය සඳහා වන ගාස්තු අය කිරීමේ දී 2022 අප්‍රේල් මාසය සඳහා 50% ක් ගාස්තු අඩු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:21 බළන්ගොඩ, රාස්සගල, 7 කණුව ලිපිනයේ පදිංචි ටී.ඒ. චන්න විමුක්ති ජයවීර යන අයට බළන්ගොඩ නගර සභා උද්‍යානයේ පෝනියෙක් පැදවීම සඳහා ලබා දීම, මිල ගණන් තීරණය කිරීම හා ඒ වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පසුගිය මහ සභාවේ දී කොන්දේසි ප්‍රකාරව ගිවිසුම්ගතව මාසිකව රු. 15,000.00 බැගින් අය කර ගනිමින් මෙම අය සඳහා පෝනියෙක් පැදවීම වෙනුවෙන් අනුමැතිය ලබා දුන් නමුත් සෙනසුරාදා හා ඉරිදා දිනයන් පමණක් පෝනියා පදවන බවටත්, අනෙකුත් දිනවල දී පෝනියා නොපදවන බවටත් ටී.ඒ. චන්න විමුක්ති ජයවීර

යන අය විසින් දන්වා ඇති බැවින් මාසික මුදල අය කිරීමේ දී එම දිනයන් සම්බන්ධව සලකා තීරණයක් ගත යුතු බව පවසන ලදී.

ඒ අනුව කොන්දේසි ප්‍රකාරව ගිවිසුම්ගතව සෙනසුරාදා සහ ඉරිදා යන දිනයන් පමණක් පෝනියා පැදවීම සඳහා අවසර ලබා දීමටත්, මාසිකව රු.5,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:22 බළන්ගොඩ නගර සභාවට අයත් බළන්ගොඩ තානායමේ ව්‍යාපාර කටයුතු ආර්ථික හා ඉන්ධන අර්බුදය හේතුවෙන් අඩාල වී ඇති නිසා 2022 අප්‍රේල් මාසයේ මාසික බදු කුලිය සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන ලෙස තානායම් ටෙන්ඩර්කරු විසින් දන්වා ඇති අතර, මේ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී රට තුල පවතින අර්බුදකාරී තත්ත්වය සලකා බලා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව තානායම් ටෙන්ඩරය සඳහා වන ගාස්තු අය කිරීමේ දී 2022 අප්‍රේල් මාසය සඳහා 50% ක් ගාස්තු අඩු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. මන්ත්‍රී යෝජනා**

06:01 **ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

06:01:01 බුද්ධ ජයන්ති මාවතේ ජල ටැංකිය අසල බිම් කට්ටි අනුමත කිරීමේ දී පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද බිම් කට්ටියේ පිඹුරේ පිටපතක් සහ පසුව එම කොටසේ නිරවුල්ව ඇති කොටසේ අඳින ලද පිඹුරේ පිටපතක් සභාව වෙත ඉදිරිපත් කරන්න

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා විසින් අදාල පිඹුරේ පිටපතක් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය සභාවේ දී කල් දී ඇති ප්‍රශ්න තුලින් තමන් කල විමසීමේ දී මෙම ස්ථානය නිරවුල්ව පවතින බව පැවසුව ද නිරවුල් නොමැති නිසා දෙවන වර සැලැස්ම සකස් කර ඇති බව ද පොදු පහසුකම් සඳහා වෙන්

කරන ලද බිම් කට්ටියේ පර්චස් ප්‍රමාණය වෙනස් වී ඇති බව ද වෙනත් පිරිසක් කොටසක පදිංචි වී සිටින බව ද ඔප්පුවෙහි සඳහන් ප්‍රමාණය භූමියේ නොමැති අතර, මෙම ප්‍රමාණය හෝ ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් තමන් සභාපති වශයෙන් කටයුතු කළ මාස 03 ක කාලයෙහි මෙම ස්ථානයට ගොස් බැලූ බව ද ඉඩම් අයිතිකරු කැඳවා මැන බැලූ විට පර්චස් ප්‍රමාණය අඩු වී ඇති බව ද දීර්ඝ කාලීනව සිටි අයෙකුගේ ඉඩම් කොටසකුත් ඇතුලත් කර පර්චස් ප්‍රමාණය ලබා දී තිබෙන අතර, පවතින භූමි ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම සඳහා මායිම් යොදා වැටක් සකස් කළ බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී ඊ.ජී.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසූවේ අනවසරයෙන් මිනිසුන් භුක්ති විඳින කොටසකුත් සමඟ මෙම ඉඩම ලබා දී ඇති අතර, නගර සභාවේ අයිතිය ගෙන ඒ මිනිසුන්ට ගෙවන ලෙස කිව යුතු බවයි.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් ඉදිරියේ දී මෙම භූමියේ අනවසර ඉදිකිරීමක් සිදු වන්නේ නම් එය වළක්වාලමින් කටයුතු කිරීම සිදු කළ යුතු බව පැවසීය.

06:02 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06:02:01 නගර සභා මහජන ක්‍රීඩාංගනයේ තණකොළ කැපීම සඳහා යාන්ත්‍රික ට්‍රැක්ටර් රථයක් ලබා ගැනීම සඳහා යෝජනා කිරීම

06:02:02 අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය පිළිබඳ සාකච්ඡා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූවේ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ තණකොළ කපා නඩත්තු කිරීම පහසු කිරීම සඳහා යාන්ත්‍රික ට්‍රැක්ටරයක් ලබා ගැනීම හා අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛය පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බැවින් මෙම යෝජනා දෙක ඉදිරිපත් කළ බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පෙ.ව 11.15 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**07:01 2022-04-29 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. වැඩිපුර අය කරන ලද ණය මුදල ආපසු ගෙවීම
02. ආපදා ණය මුදල රු.250,000.00 ක මුදලක් හා කාර්යසාධන ණය මුදල රු. 800,000.00 ක මුදලක් මැයි මාසයට අදාලව ගෙවීම
03. ක්‍රෝබ්රා බල්බ් සඳහා අවශ්‍ය බ්‍රැකට් 01 ක් රු. 1,600.00 බැගින් 35 ක් යෙදීම
04. ක්‍රෝබ්රා බල්බ් සවි කිරීම සඳහා අවශ්‍ය (Heavey) ඇණ හා වොෂර් කට්ටලයක් රු.850.00 බැගින් කට්ටල 60 ක් මිල දී ගැනීම
05. ඇස්තමේන්තු අනුමත කිරීම
    - පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය සඳහා කොන්ක්‍රීට් පුවරු ඉදි කිරීම - (රු.100,000.00)
    - පල්ලෙවෙල තරංග හපුගස්වත්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව කොන්ක්‍රීට් තහඩු යොදා ආවරණය කිරීම (රු.400,000.00)
    - තුඹගොඩ 03 වන පටුමග හා පැති බැම්ම සංවර්ධනය කිරීම - (රු.425,000.00)
    - හැටන් නැෂනල් බැංකුව අසලින් දිවෙන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම (රු.375,000.00)
    - ඒ.එල්.මුස්තාපා මාවතේ පැති කාණුව සංවර්ධනය කිරීම (රු.400,000.00)
    - ඇකඩමිය මාර්ගයේ පළමු පටුමග සංවර්ධනය කිරීම (රු. 500,000.00)
    - කුමාරගම මාර්ගයේ තුන්වන පටුමග සංවර්ධනය කිරීම (රු. 326,000.00)
    - ඕලුගංතොට කිරිදිගල සියඹලාගහවත්ත මාර්ගයේ පැති බැම්ම සංවර්ධනය කිරීම (රු.490,000.00)
    - බළන්ගොඩ උඩ ඇල්ලෙපොල මල්ලිකාරත්න මහත්මියගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම (රු.500,000.00)
    - සුනන්දාරාම මාර්ගයේ සෝදා පාළුවට ලක්වන අත්‍යවශ්‍ය ස්ථාන සඳහා වැසි ජල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම (රු. 500,000.00)
    - බුලත්ගම තලාව ගෙදර මාර්ගයේ ඇති වලවල් පිළිසකර කර ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම (රු.370,000.00)

**07:02 2022-04-29 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2022-04-01 සිට 2022-04-30 දක්වා ආදායම් හා වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 15,064,341.38 |
| වෙනත් ලැබීම් | 6,522,250.04 |
| මුලු ලැබීම් | 21,586,592.42 |
| පුනරාවර්තන වියදම් | 13,144,707.50 |
| වෙනත් වියදම් | 9,614,801.89 |
| මුලු වියදම් | 22,759,509.39 |

2022-04-01 සිට 2022-04-30 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 20,064.00 |
| 227-5020 | 50,160.00 |
| RD - 8240 | 38,720.00 |
| 226-7521 | 10,560.00 |
| BC-0005 | 21,120.00 |
| GC 0001 | 3,380.00 |
| LL - 7688 | 13,200.00 |
| JD-4684 | 5,048.00 |
| ND-5124 | 56,499.52 |
| PF-4006 | 42,412.48 |
| RC 8183 | 21,120.00 |
| RB 4786 | 14740.00 |
| GK 1483 | 31,680.00 |
| RD 8000 | 14,080.00 |
| OV/M 0017 | 3,520.00 |
| HF 7899 | 660.00 |
| LL2110 | 5,280.00 |
| HF 7899 | 17,940.00 |
| DPP 0006 | 12,180.00 |
| **එකතුව** | **382,364.00** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ඇස්තමේන්තු අනුමත කිරීම**

**09.01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

09:01:01 තුඹගොඩ, කජු කඩය පිටුපස සාංඝික මහා සුදර්මාරාම විහාරස්ථානයේ භූමිය හරහා වැටී ඇති අප ජලය බැහැරලීමේ නගර සභාවට අයත් කාණුව දෙවන අදියර සංවර්ධනය කිරීම (ඇස්තමේන්තුගත මුදල 1,316,426.07)

09:01:02 බළන්ගොඩ, තුඹගොඩ, චෙට්නෝල් පටුමග, අංක 16/20 ඩී ලිපිනය සහිත ස්ථානයේ පිහිටා ඇති,

i. ජයන්ත හෙන්දාවිතාරණ (ටෝනි) මහතාගේ තාප්පය සඳහා ඇස්තමේන්තුව - රු. 1,134,000.00 (මෙම අය ඇස්තමේන්තුගත මුදලින් 30% ක් කර්මාන්තය සඳහා ලබා දෙයි.)

ii. එම්.මහේෂ්වරී මියගේ තාප්පය සඳහා ඇස්තමේන්තුව - රු. 388,000.00 (මෙම අය ඇස්තමේන්තුගත මුදලින් 30% ක් කර්මාන්තය සඳහා ලබා දෙයි.)

iii. නගර සභාවට අයත් කාණුව සඳහා ඇස්තමේන්තුව - රු. 641,000.00

09:01:03 ප්‍රසන්න අල්විස් යන අය විසින් ඉදි කරනු ලබන ගොඩනැගිල්ල ඉදිරිපස කොටසේ නගර සභාව විසින් ඉදි කර ඇති පැති බැම්ම ඔහුගේ ඉඩම වෙත තල්ලු වී ඇති බැවින් එම කොටසේ පැති බැම්ම හා මායිම් තාප්පය ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුව - රු.927,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය දිනක හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ඇති කළ ප්‍රශ්නය නිසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා හා ප්‍රදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාසවලට දැඩි හානි සිදු වූ අතර, ඒ සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තලතා අතුකෝරාල මැතිතුමියගේත්, කොට්ඨාස කළමනාකාරතුමාගේත් අපගේත් කණගාටුව ප්‍රකාශ කර සිටින බව ද මෙම සිදුවීම කිසිසේත්ම අනුමත නොකරන බව ද පැවසූ අතර, 2022 අයවැය මගින් මන්ත්‍රී ප්‍රතිපාදනවලින් නිවාස ආධාර වෙනුවෙන් වෙන් වූ මුදලින් හෝ රුපියල් ලක්ෂ 10 මුදලින් හෝ ලක්ෂ 20 ක්වත් ගරු සභාපතිතුමා වෙත ලබා දීමට හැකි නම් එය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බවට තමන් යෝජනා කරන බව ද පවසන ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා**

ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක සිදු වූ සිදුවීමෙන් වැඩිම හානිය වූයේ ගරු සභාපතිතුමාට බව ද එදින සිදුවීම් සමග තමන් ද බියට පත් වූ බව ද මෙය ඉතා පිළිකුලෙන් යුතුව හෙළා දකින අතර, දෙවියන් වහන්සේගෙන් මෙම සිදුවීමට සම්බන්ධ වූ පුද්ගලයන් වෙත දඬුවම් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ද ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ගෙන ආ යෝජනාව නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ නොහැකි නමුත් සියලුම මන්ත්‍රීවරුන් සාමූහිකව එකතු වී සාකච්ඡා කර සහයෝගයක් ලබා දීම සුදුසු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පසුගින දින කීපය තුළ රටේ ඇති වූ විශාල කැළඹීම හේතුවෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා හා ප්‍රදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාසවලට දැඩි හානි සිදු වූ අතර, ඒ සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තලතා අතුකෝරාල මැතිතුමියගේත්, අපගේත් කණගාටුව පළ කරන

බව ද ගරු සභාපතිතුමාගේ නිවස ගොඩනැගුණු ආකාරය තමන් දන්නා බව ද එය එතුමාගේ මවගේ නිවස බව ද මෙවැනි අපරාධ කළ අය හට උපදින හැම ආත්මයකම වන්දි ගෙවීමට සිදු වන බව ද මේ සම්බන්ධව තමන් වෙත ද යම් සිදුවීමක් පැමිණි අතර තමන් පක්ෂ වෙනුවෙන් අරගලයන් කළ නමුත් මෙවැනි ද්වේශ සහගත අකටයුතුකම්වලට සම්බන්ධ නොවන බව ද තමන් මවක් බව ද පවසන ලදී.

එමෙන්ම මෙවැනි සිදුවීමක් ඇති වීමට හේතු වූයේ පොදු ජන පෙරමුණේ ඉහළ නායකයන් හා කණ්ඩායමක හැසිරීම් නිසා බව ද බළන්ගොඩ අප සැම සහෝදරයන් වශයෙන් කටයුතු කරන බැවින් ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසූ පරිදි අවශ්‍ය ඕනෑම සහයෝගයක් ලබා දීමට තමන් යෝජනා කරන බව ද ඒ සඳහා පවත්වනු ලබන සාකච්ඡාවන් වෙනුවෙන් අපව සහභාගී කරගන්නා ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් 2022 මැයි 09 වන දින ඇති වූ ම්ලේච්ඡ සිද්ධියෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා හා ප්‍රදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ නිවාසවලට දැඩි හානි සිදු වූ අතර එම සිද්ධිය පක්ෂයේ නායකතුමා, සංවිධායකතුමිය හා අප කණ්ඩායම දැඩි ලෙස හෙළා දකින බව ද ජීවිත අහිමි වූවන් වෙනුවෙන් ශෝකය පළ කරන බව ද පවසන ලදී.

එදින තමන් සිරස නාලිකාව නරඹමින් සිටි අතර, ගරු අග්‍රාමාත්‍යතුමා රටට ගෞරවාන්විත සේවයක් සිදු කර සමුගනී යැයි සිතූන නමුත් ගරු අමාත්‍යවරුන් වන ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා සහ පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය තැති ගන්වන සුලු ප්‍රකාශයන් සිදු කළ බව ද ඒ අනුව මිනිසුන් කලහකාරී ලෙස හැසිරුණු බව ද අරලිය ගහ මන්දිරයට තමන් ගොස් ඇති අතර එහි කෝටු කැබැල්ලක්වත් සොයා ගැනීමට නොහැකි නමුත් එදින එම ස්ථානයෙන් පිටවන පුද්ගලයන් අත පොලු මුගුරු පැවති බව ද අරගලකරුවන්ට ඉතා දරුණු ලෙස ප්‍රහාරයන් එල්ල කල බව ද එම සිදුවීමත් සමග මිනිසුන් කුපිත වූ අතර, බළන්ගොඩ නගරයට ද මිනිසුන් එකතු වී උද්ඝෝෂණ කළ බව ද අවමංගල්‍ය අවස්ථාවකට සහභාගී වීමට සිටි තමන් ද කෙටි වේලාවකට නගරයට පැමිණි නමුත් ගැටලුකාරී වාතාවරණයක් නුදුටු බැවින් නැවත නිවසට ගිය බව ද පැවසීය.

එමෙන්ම ගරු සභාපතිතුමාට සිදු වූ සිද්ධියෙන් පසු අද දින එතුමාට කතා කළ නමුත් ඊට පෙර කතා නොකරන ලද්දේ එවැනි සිද්ධියක් කතා කරනු ලබන්නේ කෙසේදැයි සිතා සිටි නිසා බව ද මෙම පාපකාරී සිදුවීම් දැඩි ලෙස හෙළා දකින අතර මෙවැනි සිදුවීම් නැවත ඇති නොවන්නට අවශ්‍ය උපරිම කැපවීම සිදු කරමුයි යන්න ප්‍රකාශ කරන බවද ධෛර්යයෙන් යුතුව කටයුතු කිරීමට ගරු සභාපතිතුමාට අවශ්‍ය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට සිදු වූ දේ සම්බන්ධව තම ශෝකය පළ කරන බව ද එදින තමන් ඇඹිලිපිටියේ විවාහ මංගල්‍යයකට සහභාගී වී සිටි අතර,

අරගලයේ නියුතු ශිෂ්‍යයන්ට පහර දෙන බව දැනගන්නට ලැබුණු බව ද එම දිනයේ හදිසි නීතියට විරුද්ධව බළන්ගොඩ උද්ඝෝෂණයක් සූදානම් කර තිබුණු නිසා පහර දෙන දර්ශන දැකීමෙන් පසු ඇති වූ තැති ගැන්ම මත මෙම උද්ඝෝෂණයේ නියුතු අයට පහර දේවි යැයි සිතා තමන් නැවත බළන්ගොඩට පැමිණි අතර බලගහමුල උද්ඝෝෂණයක් පැවති බව ද එහි මිනිසුන් බීමත්ව හැසිරුණු බව දැනගන්නට ලැබුණු අතර, එවිට පාලනයක් විනයක් ඇති නොවන බව ද තම පක්ෂයෙන් සංවිධානය කරනු ලබන උද්ඝෝෂණයන්හි එසේ බීමත් හැසිරෙන්නේ නැති බව ද පවසන ලදී.

එමෙන්ම තමන් අවුරුදු එක හමාරකට පෙර මෙම රටට අගලක්වත් ඉදිරියට යාමට බැරි බව හා ගරු සභාපතිතුමා පත්වන අවස්ථාවේ දී සභාපතිතුමා පත්වන්නේ නරකම කාලයේ බව පැවසූ බව ද ආර්ථික අර්බුදය, දේශපාලන අර්බුදයක් බවට පත් වී සමාජ අර්බුදයක් බවට පත් වන බව ද 2021 අප්‍රේල් 28 වන දින රසායනික පොහොර සම්බන්ධව ගත් තීරණයෙන් පසුව ගොවීන් උද්ඝෝෂණය කළ බව ද මිනිසුන් පක්ෂයකට අදාලව නොව පවතින තත්ත්වයට විරුද්ධව පාරට බැස විරෝධතාවල නිරත වූ බව ද ගරු අග්‍රාමාත්‍යතුමා සාමකාමීව සමුගනී යැයි සිතුව ද එසේ සිදු නොවුණු බව ද ප්‍රකෝපකාරී අමානුෂික පහරදීම් සිදු වූ අතර, මෙම පහර දෙන පිරිස නොවළක්වන ලෙස පොලිස්පති හා අමාත්‍යාංශ ලේකම් විසින් නියෝජ්‍ය පොලිස්පතිතුමාට නියෝග ලබා දී ඇති බව ද පැහැදිලිවම කුමන්ත්‍රණයක් මෙහි පවතින අතර මෙය පවුලේ අර්බුදයක් බව සමාජ මාධ්‍ය හරහා දුටු බව ද ඉදිරියේ දී මේ පිළිබඳව දැනගැනීමට හැකි වන බව ද මිනිසුන් මේ බව නොදැන එදින අරලිය ගහ මන්දිරයට ගිය අතර මැර කණ්ඩායම් විසින් අරගලයට පහර දුන් බව ද එය දකින දෙමව්පියන් ප්‍රකෝපකාරීව හැසිරෙන බව ද එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන පුද්ගලික පළිගැනීම් සිදු කිරීමට පිරිස් සූදානම් වන බව ද පැවසීය.

1983 කලබලයක් ඇති කර තම පක්ෂය තහනම් කරමින් විශාල බේදවාචකයක් සිදු කළ බව ද තම පක්ෂයෙන් මුල සිටම පවසන්නේ කිසිදු හේතුවක් මත ප්‍රචණ්ඩකාරීව නොහැසිරෙන ලෙසත්, ඒ සඳහා අනුබල නොදෙන ලෙසත් බවද අවස්ථා ගණනාවක දී තම පක්ෂයේ අය මරා දැමූ නමුත් පළිගැනීම් සිදු නොකළ බව ද මෙම සිදුවීම් පවා තම පක්ෂයට යොමු කරන බව දැන සිටි අතර, ඕනෑම පරීක්ෂණයකට සූදානම් බව ද තම තමන් ජනතා විමුක්ති පෙරමුණේ යැයි පැවසුව ද පක්ෂයේ සාමාජිකයෙක් වීමට කරුණු කිහිපයක් සපුරා තිබිය යුතු බව ද එසේ නොමැති අය හා පක්ෂයෙන් ඉවත් වූ අය සම්බන්ධව වගකීමක් ගත නොහැකි බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මීට පෙර පස් වරක් අගමැති ධූරය දැරූ නමුත් රට හොඳ තත්ත්වයකට නොගත් බැවින් මෙම අවස්ථාවේ දී ද එසේ කරාවි යැයි සිතිය නොහැකි බව ද එතුමා කරනු ලබන්නේ රටේ සම්පත් විකිණීම හා ණය ගැනීම බව ද පවසන ලදී. එමෙන්ම ගෝල්ෆේස් අරගල භූමියේ ඇති වූ සිද්ධියේ දී තරුණයන් විසින් ප්‍රතික්ෂේප කරන සංස්කෘතියක් සමඟ පැමිණි විපක්ෂ නායකතුමාට විරෝධයක් එල්ල වූ නමුත් අනුර කුමාර දිසානායක තම නායකතුමාට එසේ විරෝධයක් එල්ල නොවූයේ ඔහුට මෙම සිද්ධිය අවස්ථාවේ පැමිණෙන ලෙස ශිෂ්‍ය සංගම් විසින් කරන ලද ඉල්ලීම නිසා බව ද ප්‍රචණ්ඩකාරී නොවන ලෙස නිරන්තරයෙන්ම එතුමා පවසන බව ද රටේ මෙම ඇති වී ඇති තත්ත්වයට දේශපාලකයන් පමණක් නොව නිලධාරීන් ද වගකිව යුතු බව ද මැති ඇමති මන්ත්‍රී සියලුම දෙනා කැපකිරීමක් කරන්නේ නම් මෙම රට නිවැරදි මාවතට ගත හැකි බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහ ගරු සභාපතිතුමාගේ නිවාස හා දේපලවලට සිදු වූ විනාශය සම්බන්ධයෙන් තමන්ගේත් තම පක්ෂයේත් කණගාටුව ප්‍රකාශ කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය පෙ.ව 11.50 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ප.ව 12.00 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ප.ව 12.00 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මැයි 09 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ සහ ගරු සභාපතිතුමාගේ නිවාස හා දේපලවලට සිදු කල විනාශය පිළිකුලෙන් යුතුව හෙළා දකින අතර, කණගාටුව ප්‍රකාශ කරන බව ද ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුල තමන්ට කැමති දේශපාලන මතයක් නියෝජනය කිරීමට ඇති අයිතිය මත ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු වී ගරු ජනාධිපතිතුමා පත් කිරීමටත් අගමැති වශයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කිරීමටත් ආණ්ඩුවක් ස්ථාපිත කිරීමටත් දායක වූ බව ද එම අවස්ථාවේ රටේ පැවති තත්ත්වයට හොඳම විසඳුම ලෙස එය ඉටු කළ බව ද නිවාස අහිමි වූයේ තම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අයිතිය භාවිත කිරීම හේතුවෙන් ද යන්න ප්‍රශ්නයක් බව ද අරලියගහ මන්දිරයේ ඇති වූ සිදුවීම අනුමත නොකරන බව ද පවසන ලදී.

එමෙන්ම රට මෙවැනි තත්ත්වයකට යා හැකි බව දැනුණු නිසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ජනවාරි මාසයේ සිට තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 10 දෙනෙකු සමඟ ස්වාධීන කණ්ඩායමක් වශයෙන් සිටි බව ද එවැනි පියවරක් ගනු ලැබුවේ රට නිවැරදි මාර්ගයට යොමු කිරීම සඳහා බව ද අපගේ නායකයන් ජනතාවගේ ප්‍රශ්නවලට සංවේදී නොවුණු බව ද පැවසීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගෝල්ෆේස් අරගලය නිර්මාණය වූ අතර, සමස්ථ ජනතාවගේම නියෝජනයක් එහි තිබූ බව නායකයන් තේරුම් නොගැනීම තුල මෙවැනි සිද්ධීන් ඇති වූ බව ද වසර ගණනාවක් දේශපාලනය කර බලයට ගෙන ඒමට කටයුතු කළ අහිංසක පාක්ෂිකයන්ගේ ජීවිත හා දේපල අවදානමකට ලක් කිරීම දැඩි ලෙස හෙළා දකින බව ද ඉදිරියේ දී රට නිවැරදි දිශානතියකට ගැනීමට හැකි දේශපාලන ව්‍යාපාරයක නිරත වී ජනතාව වෙනුවෙන් කළ යුතු යුතුකම් ඉටු කරන බව ද එය කෙසේ වෙතත් ගරු සභාපතිතුමා හට සභාව කරගෙන යාමට අවශ්‍ය සියලු සහයෝගය ලබා දෙන බව ද පවසමින් 09 වන දා ඇති වූ තත්ත්වය සම්බන්ධව තමාගේත්, තම පවුලේත් කණගාටුව ප්‍රකාශ කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ප.ව 12.10 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මැයි 09 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ සහ ගරු සභාපතිතුමාගේ නිවාස හා දේපලවලට සිදු කල විනාශය පිළිකුලෙන් යුතුව හෙළා දකින අතර, තමාගේ, පක්ෂයේ හා තම පවුලේ කණගාටුව ප්‍රකාශ කරන බව පවසන ලදී.

එමෙන්ම හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා තම අගමැති ධූරයට සමු දෙන අවස්ථාවට පළාත් පාලන ආයතන නියෝජිතයන් කැඳවා තිබුණු අතර, එහි ගිය 99%ක් දෙනා මෙවැනි තත්ත්වයක් ඇති වේ යැයි නොසිතන්නට ඇති බව ද අගමැතිතුමා දූරදර්ශී පරිණත දේශපාලකයෙක් වශයෙන් එවැනි සිද්ධියක් ඇති කරාවි යැයි නොසිතන නමුත් මහජන නියෝජිතයින් කිහිපදෙනෙක් මෙම තත්ත්වය උදා කර ඇති බව ද ප්‍රචණ්ඩත්වයට ප්‍රචණ්ඩත්වයෙන් පිළිතුරු ලබා නොදිය යුතු අතර, සාකච්ඡාවෙන් හා සම්මුතියෙන් විසඳා ගත යුතු බව ද ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය නැති වී ඇති බැවින් සියලුම පක්ෂයන් හා නායකයන් එක් වී රටේ සාමය හා නීතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය දිනවල කසළ එකතු කිරීමේ ප්‍රමාද වීමක් සිදු වූ අතර, ඒ සම්බන්ධව අදාල ටෙන්ඩර්කරුගෙන් විමසීමේ දී ඉන්ධන අර්බුදය නිසා එසේ වූ බව හා වර්ෂා කාලයේ දී ට්‍රැක්ටර් රථවල වහල තෙමෙන බැවින් රියදුරන් අනාරක්ෂිත වී ඇති බව එහි දී සඳහන් කළ බව ද පැවසීය. එම නිසා ඒ සම්බන්ධව සොයා බලන ලෙස ද 2018 මැතිවරණයේ සිට ජනතාවගේ යහපත වෙනුවෙන් දේශපාලනය කළ අතර, බිම් මට්ටමේ මහජන නියෝජිතයින් වශයෙන් කෙදිනකවත් වෛරී දේශපාලනයක් නොකළ බව ද රට සංවර්ධනය කරා යාමේ අරමුණින් දේශපාලන නායකයන් පත් කිරීමට අවශ්‍ය සහයෝගයන් ලබා දුන් නමුත් මැයි 09 සිදු වූ සිදුවීම පිළිබඳ කණගාටු වන බව ද මේ නිසා බිම් මට්ටමේ නායකයන්ට මෙවැනි හානි සිදු වූ බව ද ගරු සභාපතිතුමාගේ දරුවන් සමඟ කතා කළ අතර, එම අවස්ථාවේදී දේශපාලනය එපා වූ බව ද එදින ගරු නාගරික මන්ත්‍රීවරුන් තමන් ගැන ද සොයා බැලූ බැවින් ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද ගරු සභාපතිතුමාට සභාව කරගෙන යාමට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙන බව ද සිදු වූ හානිය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහ ගරු සභාපතිතුමාට තම කණගාටුව ප්‍රකාශ කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක ගරු සභාපතිතුමාගේ නිවසට හා දේපලවලට සිදු වූ හානිය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බව ද තමන් දේශපාලනයට හඳුන්වා දුන්නේ එතුමා බව ද අවුරුදු 16 ක් දේශපාලනය කර මිනිසුන් හම්බ කළ බව ද කෙසේ හෝ මෙම අපරාධයන් සිදු කල පුද්ගලයන්ට සමාජයෙන් හා දෙවියන්ගෙන් දඬුවම් ලැබෙන බව ද ගරු සභාපතිතුමාට මෙන්ම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත තම කණගාටුව ප්‍රකාශ කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක සිදු වූ හානිය සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහ ගරු සභාපතිතුමාට තම කණගාටුව ප්‍රකාශ කරන බව ද ජනතාව වෙනුවෙන් කැප වී කටයුතු කළ

මෙතුමන්ලා හට මෙවැනි ප්‍රශ්නයක් ඇති වූයේ ඇයිදැයි කෙසේදැයි ගැටලුවක් පවතින අතර තමන් තදින්ම මෙයට විරුද්ධ බව ද රට ඉතාම පහළ තත්ත්වයකට වැටී ඇති මෙම මොහොතේ දේශපාලනය කතා නොකර රට ගොඩනැගීමට අවශ්‍ය සහයෝගයන් සියලු පක්ෂයන් විසින් ලබා දිය යුතු බව ද ගරු විපක්ෂ නායකතුමා හා ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා හට අගමැතිකම භාරගෙන රට ගොඩනැගීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු ජනාධිපතිතුමා විසින් ආරාධනා කළ ද විවිධ කොන්දේසි ඉදිරිපත් කරමින් එය මඟ හරින ලද නමුත් එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එම අභියෝගය භාරගෙන කටයුතු කරන බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය දිනක අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් ෆයිල් මිටියක් ඉදිරිපත් කළ අතර, එතුමාට ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ එකතු වී අධිකරණ ඇමති ධූරය ලබා ගෙන අවශ්‍ය නම් නඩු දැමීමේ හැකියාව පවතින නමුත් එසේ නොකරන බව ද මෙම රට ගොඩනැගීම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් අසනීප වී බෙහෙත් ලබා ගැනීමටත් නඩුවක් සඳහා උසාවි යාමටත් තිබූ නිසා සභාවට පැමිණීම ප්‍රමාද වූ බව ද ගරු සභාපතිතුමා මුහුණ දුන් ඛේදවාචකයට තමන් මීට වසර 22 කට පමණ පෙර මුහුණු දුන් අතර, එදා ඇති වූ වේදනාව බෙදා ගැනීමට සිටි ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු මෙම සභාවේ සිටින බව ද ඉන් එක් අයෙකු වන්නේ වත්මන් ගරු සභාපතිතුමා බව ද තමන්ගේ නිවස ගිනි තැබීමට සූදානම් වූ අවස්ථාවේ දී එතුමා තම නිවස බේර ගත් බව ද තම ව්‍යාපාරය ගිනි තබා ලක්ෂ 03 කට අධික දේ මංකොල්ල කෑ බව ද ඉන්පසුව පැවති මැතිවරණ 04 න් ජයගත් තමන් කිසිවෙකුටවත් උදව්වක් මිස වරදක් සිදු නොකළ බව ද බොරු චෝදනා ඉදිරිපත් වූ විට කලක දී එම චෝදනා නඩු විභාගයේ දී ඉවත් වන බව ද පවසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමාට මෙය සිදු වූයේ දේශපාලනය කළ නිසා බව ද තමන් එදින බියෙන් සිටි අතර, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පක්ෂ විපක්ෂ නොබලා කටයුතු කරන අයෙක් බව ද ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ද එවැනි පුද්ගලයෙකු බව ද පාර්ලිමේන්තුවේ දී ජනතා විමුක්ති පෙරමුණෙහි අය සහ සමගි ජන බලවේගයේ අය සම්බන්ධ බවට කතා කළ බව ද අරලිය ගහ මන්දිරයේ දී හිටපු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රහාර එල්ල කරන ලෙස දැනුම් නොදුන් බව ද පොඩි දෙයක් ලොකු දෙයක් වශයෙන් පෙන්නා ඇති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අද වන විට ඉන්ධන හා ගෑස් සඳහා පෝලිම් ඇති වී ඇති බව ද පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතු වන ලෙස හෝ එසේ නැතිනම් හැකි අයෙකු ඉදිරිපත් වී ආණ්ඩුව කරන ලෙස ගරු ජනාධිපතිතුමා විසින් දැනුම් දුන් බව ද සහල්, ගම්මිරිස්, තේ ඇතුළු ද්‍රව්‍ය සඳහා ඉහළ මිලක් පවතින නිසා මුදල් ගැටලුවක් නොමැති බව ද භාණ්ඩ හිඟතාවය පමණක් පවතින බව ද දේශපාලන භේදයකින් තොරව සභාවේ කටයුතු සිදු කළ යුතු අතර, ගරු සභාපතිතුමාට අවශ්‍ය සහයෝගය ලබා දෙන බව ද මෙම අපරාධය සිදු කළ අය හට තරාතිරම නොබලා දඬුවම් නොකළහොත් පූර්වාදර්ශයකට යන බව ද ගරු සභාපතිතුමා වෙත තමාගේ හා පවුලේ කණගාටුව ප්‍රකාශ කරන බවද ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම

සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් අද දින දේශපාලනය ගැන නොව ගොඩනැගීම ගැන පමණක් කතා කිරීමට ඇති බව ද මින් ඉදිරියට දේශපාලනය කරන්න හැකි ද යන්න සම්බන්ධව විශාල අභියෝගයක් පවතින බව ද මැයි 09 වනදා රාත්‍රියේ තමන්ට දුරකතන ඇමතුම් 61 ක් ලැබුණු අතර, එම ඇමතුම් මගින් තමන්ට නිවසින් පිටවන ලෙස පැවසූ බව ද දින 04 ක් නිදිවර්ජිතව සිටි බව ද නිවසින් පිටවන ලෙස පැවසුව ද යාමට වෙනත් ස්ථානයක් නොමැති බව ද දේශපාලනයට පිවිස පසුගිය වර්ෂ 04 තුල තමන් වෙනුවෙන් කරගත් දෙයක් නොමැති අතර, ව්‍යාපාරිකයෙක් වශයෙන් ගොඩනගා ගත් දේ පමණක් ඇති බව ද පසුගිය වර්ෂ 04 ක කාලය සහරාන් බෝම්බ සිද්ධිය, කොරෝනා වසංගතය සහ මැයි 09 සිද්ධිය නිසා ගෙවී ගිය අතර, මෙම කාල පරිච්ඡේදය තුල කිසිම දෙයක් සාර්ථකව අවසන් කිරීමට නොහැකි වූ බව ද මෙම අභියෝගයන් ජයගෙන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සහ ගරු සභාපතිතුමා යන තිදෙනා ගොඩනැගීම වෙනුවෙන් සියලු දෙනා එකතු වී කටයුතු කළ යුතු බව ද ගරු සභාපතිතුමාට සභාව පවත්වාගෙන යාමට ඉදිරියටත් සහයෝගය ලබා දෙන බව ද සිදු වූ සිද්ධීන් සම්බන්ධව කණගාටුව ද ප්‍රකාශ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ප.ව 12.35 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**11. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ජාතික වෙසක් උත්සවය සාර්ථක කර ගැනීම සඳහා දායකත්වයක් ලබා දීමට දැඩි කැමැත්තෙන් සිටි නමුත් එය ඉටු කිරීමට නොහැකි වීම සම්බන්ධව කණගාටුවට පත්වන බව ද ගරු ආණ්ඩුකාරතුමා පසුගිය මැයි 07 වන දා කතා කර වෙසක් උත්සවය වෙනුවෙන් විදුලි ආලෝකකරණය සිදු කිරීමේ කටයුතු සිදු කරන ලෙස පැවසූ අතර, ඒ සඳහා පැමිණි අය වෙනුවෙන් නවතැන් පහසුකම් හා ආහාරපාන ලබා දුන් නමුත් මැයි මස 09 වන දින සිදු වූ සිද්ධිය සමඟ මෙය අවලංගු වූ බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය කාලයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ඉටු කරමින් පැවති වැඩ කටයුතු නවතා දැමුණු බැවින් නැවත එම කාර්යයන් ආරම්භ කර ඉක්මනින් ඉටු කරගන්නා ලෙස ද තමන් සභාපති වශයෙන් පත් වූ දා සිටම නිරන්තරයෙන්ම දුරකථන ඇමතුම් මගින් තමන්ට ඉවත් වන ලෙස පැවසූ අය සිටි නමුත් ඔවුන් කවුරුන්දැයි සොයා ගැනීමට නොහැකි වූ බව ද එම නිසා පසුගිය දින සිදු වූ සිදුවීම එක්වර ඇති වූවක් නොවන බව ද තමන් සභාපති වශයෙන් පත් වී මාස 02 දින 28 ක කාලයක් වන අතර, පසුගිය 09 වන දා සභාවේ තමන් සිටි බව ද බොහෝ දුරකතන ඇමතුම් ප්‍රමාණයක් ලැබුණු බව ද කාර්යාලය බොහෝ පිරිසක් විසින් වට කළ බව ද ඒ අතරතුර වෙසක් උත්සවය සම්බන්ධව zoom ඔස්සේ සාකච්ඡාවක් පැවති අතර එයට ටික වේලාවක් සම්බන්ධ වී නිළධාරියෙකුගේ වාහනයකින් සභාවෙන් පිට වූ බව ද අනතුරුව තමන්ගේ නිවසට වාහනයක් යවා පවුලේ අය ආරක්ෂක ස්ථානයකට ගෙන්වා ගත් අතර, ඇඳ සිටි ඇඳුම පමණක් අවසානයේ ඉතිරි වූ බව ද ගින්න ඇවිලුණු අවස්ථාවේ එය

නිවීමට සභාවේ කිහිපදෙනෙකු උත්සාහ කළ බව ද නිලධාරීන් නිරන්තරයෙන් දුරකතන ඇමතුම් ලබා දී ආරක්ෂාකාරීව සිටින ලෙස පැවසූ බව ද බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තම කාර්යාලයේ පවතින ජල බවුසරය ගෙන්වා ගැනීමට උත්සාහ කළ නමුත් එය ඉටු කර ගැනීමට නොහැකි වූයේ නිලධාරීන් එම අවස්ථාවේ බියෙන් සිටි නිසා බව ද තමන් එවැනි කාර්යයක් ඉටු කර ගැනීමට උත්සාහ නොගත්තේ නිලධාරීන්ගේ ආරක්ෂාව සම්බන්ධව සිතූ නිසා බව ද පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, තමන් ගැන සොයා බැලූ උදව් උපකාර කළ සියලු දෙනාට ස්තුතිවන්ත වන බව ද බළන්ගොඩ ඉතිහාසයේ කවරදාවකවත් පැමිණ නැති දේශපාලකයන් හා පිරිස් නිවසට පැමිණි අතර එම අයට වචනයකින් හෝ හිංසාවක් නොකළ බව ද බළන්ගොඩ ගිනි තැබූ අවසාන නිවස තමාගේ විය යුතු අතර, මින් ඉදිරියට කිසිවෙකුටත් මෙවැනි කරදරයක් සිදු නොවේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.50ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.